# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 278 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 15/02/2024 පැය 2115

# මාධ්‍ය නිවේදනය

## 01. මාරක රිය අනතුරක් - රුවන්වැල්ල පොලිස් වසම.

2024.02.14 වන දින උදෑසන කාලයේ රුවන්වැල්ල පොලිස් වසමේ රුවන්වැල්ල නිට්ටඹුව මාර්ගයේ 05 කණුව ප්‍රදේශයේදී රුවන්වැල්ල දෙස සිට නිට්ටඹුව දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව නවතා තිබූ ලොරි රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු කරවනැල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ රඹුක්පිටිය, නාවලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරවනැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් ඇත. රුවන්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - කුලියාපිටිය පොලිස් වසම.

2024.02.14 වන දින උදෑසන කාලයේ කුලියාපිටිය පොලිස් වසමේ කුලියාපිටිය මාදම්පේ මාර්ගයේ පල්ලෙවෙල ප්‍රදේශයේදී මාදම්පේ දෙස සිට කුලියාපිටිය දෙසට කාර්මික දෝෂයකට ලක්වූ වෑන් රථයක් ඇදගෙන යමින් සිටි ලොරි රථයක් ඊට ඉදිරියෙන් ගමන් කල ලොරි රථයක් තිරිංග තද කිරීම හේතුවෙන් දකුණට හැරවීමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ත්‍රිරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු හා පිටුපස ගමන්කල ඔහුගේ බිරිඳ කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී රියදුරුගේ බිරිඳ මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 37 ක් වූ අලවල, අඹකොටෙ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් ඇත. කුලියාපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි

## 03. මාරක රිය අනතුරක් - අලදෙණිය පොලිස් වසම.

2024.02.15 වන දින උදෑසන කාලයේ අලදෙණිය පොලිස් වසමේ මහනුවර - පුත්තලම ප්‍රධාන මාර්ගයේ අලදෙණිය ප්‍රදේශයේදී කටුගස්තොට සිට කුරුණෑගල දෙසට ගමන් ගත් ජීප් රථයක් රියදුරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගය හරහා ගොස් කුරුණෑගල දෙස සිට මහනුවර දෙසට ගමන් ගත් යතුරු පැදියක ගැටී අනතුරක් සිදු වී ඇත.

අනතුරින් යතුරු පැදිකරු සහ පසුපැදිකාරිය තුවාල ලබා තිත්තපජ්ජල රෝහලට ඇතුළත් කිරීමේදි යතුරු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ මැල්සිරිපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය තිත්තපජ්ජල රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අලදෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.02.14 වන දින රාත්‍රී කාලයේ කොළඹ අපරාධ කොට්ඨාසයේ බස්නාහිර පළාත් දූෂණ මර්ධන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ගැමුණු පාර ප්‍රදේශයේදී හෙරොයින් **ග්‍රෑම් 06 ක් මිලි ග්‍රෑම් 690 ක් සන්තකයේ** තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 23 ක් වූ ගැමුණු පාර, ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. විදේශීය දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ගුවන් තොටුපල ඒකකය.**

2024.02.15 වන අද දින කටුනායක ගුවන් තොටුපල පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව වැටලීමක් සිදු කර ඩුබායි සිට මෙරටට පැමිණෙන ලද ගුවන් මගියෙකු පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබි නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද විවිධ වර්ගයේ විදේශීය දුම්වැටි 19,000 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 59 ක් වූ කොට්ටුකච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශ කටුනායක ගුවන් තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**